# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2170/6 - 2020 අප්‍රේල් මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2020.04.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රේගු නිවේදනය**

ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 02/2020

**1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත**

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් පනවන ලද පහත සඳහන් ආඥාව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

**එස්. ආර්. ආටිගල,**
ලේකම්,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය.

2020 අප්‍රේල් මස 09 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත**

ආඥාව

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 2020 අප්‍රේල් මස 10 වැනි දින සිට, මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවේ අනුරූප සටහන්වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥා පනතේ "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතුවන හා ගෙවිය යුතුවන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන්වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බවට ද, රේගු අධ්‍යක්ෂ ජනරාල්ට මෙම ආඥාව මගින් නියම කරමි.

**මහින්ද රාජපක්ෂ,**
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 අප්‍රේල් මස 09 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

1A - PG 4962 — 567 (2020/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### උපලේඛනය

| ශීර්ෂ අංකය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය වරණීය (4) | සාමාන්‍ය (5) | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| **27.10** | | | අශුද්ධ තත්ත්වයේ හැර, පැට්‍රොලියම් තෙල් වර්ග සහ ගල්කීලමය ඛනිජ වර්ගයන්ගෙන් ලබාලත් තෙල් වර්ග ; බරෙන් 70%කට නොඅඩුව පැට්‍රොලියම් තෙල් වර්ග හෝ ගල්කීලමය ඛනිජ ද්‍රව්‍යයන්ගෙන් ලබාගත් තෙල් වර්ග අඩංගු, මෙකී තෙල් වර්ග සංයෝජනවල මූලික සංඝටක ද්‍රව්‍යයන් වශයෙන් ඇති, අන්තැක නිශ්චිතව සඳහන්කොට හෝ ඇතුළත් කොට නොමැති, සංයෝජන වර්ග ; වේස්ට් ඔයිල්. | | | |
| | | | | | | |
| | 2710.19.70 | --- | ස්නේහක නිපදවීමට ගන්නා ලිහිසිතෙල් (මූලික තෙල්) | | 30% හෝ කි.ග්‍රෑමයකට රු. 45.00 | කි.ග්‍රෑ. |
| | 2710.19.80 | --- | ස්නේහක තෙල් | | 30% හෝ කි.ග්‍රෑමයකට රු. 115.00 | කි.ග්‍රෑ. |
| | | | | | | |
| **34.03** | | | (ස්නේහක පදනම් කොටගත්, කැපුම්-තෙල් සකස් කිරීම්, ඇණ මුරිච් ගැලවීමේ සකස් කිරීම්, මළනාශක හෝ විබාදන නාශක සකස් කිරීම් සහ අච්චු ගැලවීමේ සකස් කිරීම් ඇතුළුව) බරින් 70%ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වූ ස්නේහක සකස් කිරීම් සහ ගල්කීලමය (බිටුමිනස්) ඛනිජ ද්‍රව්‍යවලින් ලබාගත් තෙල් හෝ පැට්‍රොලියම් තෙල් වර්ග මූලික සංඝටක වශයෙන් අඩංගුව ඇති සකස් කිරීම් හැර, රෙදි පිළි, සම්, ලොම් සම් හෝ වෙනත් ද්‍රව්‍යයන්, තෙල් හෝ ග්‍රීස් ගල්වා සකස් කිරීම සඳහා, යොදා ගනු ලබන වර්ගයකට අයත් සකස් කිරීම්. | | | |
| | | - | ගල්කීලමය ඛනිජවලින් ලබාගත් තෙල් හෝ පෙට්‍රෝලියම් තෙල් අන්තර්ගත වූ ඃ | | | |
| | | | | | | |
| | 3403.19 | -- | අනෙකුත් | | | |
| | 3403.19.10 | --- | මෝටර් වාහන සඳහා භාවිත කරනු ලබන ලිහිසි තෙල් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | 30% හෝ කි.ග්‍රෑමයකට රු. 50.00 | කි.ග්‍රෑ. |
| | | | | | | |
| | | - | අනෙකුත් ඃ | | | |
| | 3403.99 | -- | අනෙකුත් | | | |
| | 3403.99.10 | --- | මෝටර් වාහන සඳහා භාවිත කරනු ලබන ලිහිසි තෙල් | (PK) නිදහස්<br>(IN) නිදහස්<br>(SF) නිදහස්<br>(SD) නිදහස් | 30% හෝ කි.ග්‍රෑමයකට රු. 50.00 | කි.ග්‍රෑ. |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.